# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය සඳහා බදු කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම

**ගොඩනැගිලි පරිශ්‍රය**

| |
|---|
| **වර්ග අඩිප්‍රමාණය** |
| වර්ග අඩි 6,000 ට නොඅඩු විය යුතුය |
| **අවශ්‍ය පිරිවිතර** |
| ඇඹිලිපිටිය නගර සීමාව තුළ තිබිය යුතුය |
| ජලය, විදුලිය, දුරකථන පහසුකම් |
| වැසිකිලි හා කැසිකිලි පහසුකම් |

**<u>ඊට අමතරව පහත පහසුකම් සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ</u>**

* පොලිස් ස්ථානය,බැංකු,අධිකරණ සංකීර්ණය,තැපැල් කාර්යාලය,බස් නැවතුම් පොල හා ප්‍රධාන මාර්ගය ආසන්න පිහිටි නවනගර ප්‍රදේශය වඩාත් සුදුසුය
* වාහන සඳහා බාධාවකින් තොර පිවිසුම් මාර්ගයක් තිබිය යුතුය
* වාහන නැවැත්වීමට ප්‍රමාණවත් ඉඩකඩක් තිබිය යුතුය (අවම වශයෙන් වාහන 10ක් වත් නවතා තැබිය හැකි ඉඩ පහසුකම් තිබිය යුතුය)
* අපේක්ෂිත ගොඩනැගිලි පරිශ්‍රයට වෙන් වූ තෙකලා විදුලි පහසුකම් හා ජල පහසුකම් තිබිය යුතුය
* මහල් ගොඩනැගිල්ලක් නම් බිම් මහල හෝ පළමු මහල විය යුතුය
* කාර්ය මණ්ඩලයට හා පැමිණෙන මහජනයාට ප්‍රමාණවත් තරම් වැසිකිලි පහසුකම් තිබිය යුතු අතර මහල් ගොඩනැගිල්ලක් නම් ප්‍රමාණවත් පරිදි එක් එක් මහලට වෙන් වූ වැසිකිලි පහසුකම් තිබිය යුතුය
* පිවිසුම් මාර්ගය වැසීමට හැකි වන සේ ගේට්ටුවක් තිබිය යුතු අතර ගොඩනැගිලි පරිශ්‍රය ආරක්ෂිත ලෙස අගුල් දමා වැසිය හැකි විය යුතුය
* වායු සමන පද්ධතිය හා විදුලි පංකා සවිකර තිබීම හෝ බදු ගිවිසුම අත්සන් කිරීමට පෙර සවිකර දීමේ හැකියාව
* ගිනි ආරක්ෂණ උපකරණ සවිකර තිබිය යුතුය
* විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට පැමිණිම සඳහා ප්‍රවේශ මාර්ගයක් තිබීම හෝ බදු ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉදිකර දීමේ හැකියාව
* ආරක්ෂක නිලධාරීන්ට රැඳී සිටීමට ගොඩනැගිල්ලට පිටතින් කුටියක් සහ බාහිර වැසිකිළි පහසුකම් තිබීම හෝ බදු ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉදිකර දීමේ හැකියාව

ගොඩනැගිල්ලේ අභ්‍යන්තර සැලැස්මක් සහ ගොඩනැගිල්ලේ හිමිකම තහවුරු කෙරෙන තොරතුරු ඇතුලත් ඔබගේ මිල ගණන් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුද්‍රා තබා **2026.04.21 දින ප.ව. 2.00ට පෙර** බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 234/ඒ3 හි පිහිටි රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමු කිරීම හෝ අතින් රැගෙන විත් ඉහත වේලාවට පෙර දෙපාර්තමේන්තුවේ සැපයීම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදුකල යුතුය. මිල ගණන් බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ **<u>"ඇඹිලිපිටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය සඳහා බදු කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම"</u>** යනුවෙන් සඳහන් කළ යුතුය.

**2026.04.21** දින ප.ව 2.00 ට ලංසු විවෘත කරනු ලබන අතර එකී වේලාවට පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්<br>
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව<br>
2026.03.24